**කොළඹ විශ්වවිද්‍යාලය - 2020**
**---------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ  මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය  සහ  එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති **1980** අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය නියමාවලියේ 20 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර,  කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබෙද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 54 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ පන්තියකට අයත් එක් වත්කමක ප්‍රත්‍යාගණිත අගය වැඩිවීම හෝ අඩුවීම , වෙනත් වත්කම් පන්ති වලට අයත් වත්කම් ප්‍රත්‍යාගණන අගයට හිලව් නොකළ යුතු වුවත් ශ්‍රීපාලි මණ්ඩපයේ කාර්යාල උපකරණවල ප්‍රත්‍යාගණන ඌනතාවය වූ රු.5,437,395 ක් විද්‍යාගාර හා ඉගැන්නුම් උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් හිලව් කිරීම නිසා ප්‍රත්‍යාගණන සංචිතය හා වාර්ෂික අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 55 ඡේදයේ සඳහන් ප්‍රතිපාදනයන්ට පටහැනිව වත්කම් ප්‍රත්‍යාගණන සංචිතවලින් රු.42,248,667 ක් ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රමක්ෂය ( Amortization of Capital Grant) යටතේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායමට ගැලපුම් කර තිබීමෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය හා ප්‍රත්‍යාගණන සංචිතය වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | සම්පූර්ණ ක්ෂය කල වත්කම් වල අතිරික්ත ක්ෂය ප්‍රමාණය වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට බැර කර ඇති බැවින් වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙන් මාරුකිරීම සිදුකර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් නමුත් දැනටමත් භාවිත වෙමින් පවතින එකතුව රු.80,706,090 ක් වූ දේපළ, පිරියත හා උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 3 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශ වල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | අස්පෘශ්‍ය වත්කම් සෑම වර්ෂයකදීම ජීවිත කාලය ඇගයීම ප්‍රායෝගික නොවේ. මෙම ගිණුම් 2021 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම විශ්ලේෂණය කෙරේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේපල , පිරියත හා උපකරණ ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්‍රීඩා උපකරණවල ක්ෂය කිරීමේ ප්‍රතිශතය සියයට 25 ක් වුවද අවස්ථා 17 කදී එම ප්‍රතිපත්තියෙන් බැහැරව ක්ෂය ගණනය කිරීම නිසා සමාලෝචිත වාර්ෂයට අදාල ක්ෂය රු.1,299,182 ක් අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි. ඒ අනුව වර්ෂයේ අතිරික්තය හා ක්‍රීඩා උපකරණවල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මෙහි දැක්වෙන වත්කම් 17 ගිණුම්කරණ මෘදුකාංගයට ඇතුළත් කිරීමේදී වත්කම් හදුනාගැනීමේ ආකෘතිය වැරදි ලෙස ඇතුලත් කර ඇත. ඒ නිසා වාර්ෂික ක්ෂය ගණනය විචලනය වී ඇත. එය නිවැරදි කිරිමට කටයුතු කරනු ඇත. | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කොළඹ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.16,639,832 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 696,404,210 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.713,044,042 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ දීමනාව සහ ව්‍යාපෘති දීමනාව ඇතුළු සමස්ථ ආදායම රු.240,814,933 කින් වර්ධනයත් සේවක පාරිතෝෂිත වෙන්කිරීම් රු.645,403,392 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ විවිධ පීඨයන් විසින් ආරම්භ කර තිබූ අරමුදල් 35 ක සමාලෝචිත වර්ෂය අවසන් දිනට එකතුව රු.96,941,682 ක් පැවතියද එම අරමුදල් අදාළ අරමුණු වෙනුවෙන් වැය කිරීමට කටයුතු කර නොතිබුණි. විද්‍යා පීඨය මඟින් ශිෂ්‍යත්ව පිරිනැමීමට ආරම්භ කර තිබූ අරමුදල් 11 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.1,162,177 ක් වසර 2 සිට වසර 25 දක්වා කාල පරාසයක් තුළදී ශිෂ්‍යත්ව පිරිනැමීමට උපයෝගිකර නොතිබුණි. | 2020 වර්ෂයේ රුපියල් මිලියන 272ක් මෙම ලෙජර් ගිණුම් තුලින් වැය කර ඇත. 2020 වර්ෂයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ක්‍රීඩා කටයුතු නොතිබූ බැවින් එම වියදම් සාපේක්ෂව අඩු වී ඇත.<br>මෙම ශිෂ්‍යත්වයන් පිළිබඳව ප්‍රචාරය කළද සමහර ශිෂ්‍යත්වයන්ට අයදුම්පත් කිසිවක් ලැබී නොතිබීම, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා අරමුදල් හිඟකම වැනි හේතු බලපාන ලදී. තවද ශිෂ්‍යත්ව පිරිනැමීමේ ක්‍රියාවලියේ යම් කිසි ප්‍රමාදක් සිදු වී ඇත්නම් ඉදිරියේ දී ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග ගනු ලබන බවද මෙයින් දන්වනු කැමැත්තෙමි. | අරමුදල් ස්ථාපිත කාර්යයන් / අරමුණු සඳහා කාලීනව වැය කළ යුතු අතර ශිෂ්‍යත්ව පිරිනැමීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කළ යුතුය. |
| (ආ) | නිලධාරින් 61 දෙනෙකුගෙන් වසර 01 සිට වසර 32 දක්වා පැරණි එකතුව රු.1,351,164 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවය අතහැර ගොස් ඇති සේවයෙන් ඉවත් වී ඇති සහ මියගොස් ඇති සේවකයන්ගේ ණය මුදල් අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. වැඩ තහනමට ලක් වූ සේවකයන්ගේ ණය මුදල් පරීක්ෂණ කටයුතු අවසන් වීමෙන් පසු අයකර ගැනීමට පියවර ගනු ලැබේ. ස්ථාන මාරු ලබා ගිය සේවකයන්ගේ ණය මුදල් අය කර ගැනීම සඳහා සිහිකැඳවීමේ ලිපි අදාළ ආයතන වෙත යොමු කර ඇත. | අදාළ ණය මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) | පශ්චාත් උපාධි සම්පූර්ණ කිරීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා තිබූ ආචාර්යවරු 18 දෙනෙකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නොමැතිව නැවත සේවයට වාර්තා කර තිබීම හේතුවෙන් අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු.78,241,772 ක් විය. එසේම නැවත සේවයට වාර්තා කර නොතිබූ ආචාර්යවරු 12 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 02 සිට වර්ෂ 18 දක්වා පැරණි එකතුව රු.20,212,040 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කළමනාකරණය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ආචාර්යවරු අතුරින් 7 දෙනෙකු සේවයේ යෙදී සිටිමින් ඔවුන්ගේ ආචාර්ය උපාධිය සම්පූර්ණ කර ඇති අතර අදාළ උපාධි සහතික ඉදිරිපත් කිරීමට ඔවුන් කටයුතු කර ඇත. ආචාර්යවරුන් 8 දෙනෙකු ඔවුන්ගේ ආචාර්ය උපාධි තවදුරටත් හදාරමින් සිටින බව විශ්වවිද්‍යාලය වෙත දන්වා ඇත. ආචාර්යවරු තිදෙනෙකුගේ ගිවිසුමෙහි පාඨමාලාව සාර්ථක ලෙස නිම කල යුතු යැයි වගන්තියක් නොමැති බැවින්,නීති කමිටුවේ නිර්දේශය මත පාලක සභාව විසින් එම ගිවිසුම් ගත මුදල ගෙවීමෙන් නිදහස් කිරීමට තීරණය කර ඇත. විදේශ ගත වී නැවත සේවයට වාර්තා | ගිවිසුම්ගත පරිදි අදාළ වටිනාකම් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නොකළ ආචාර්යවරුන්ට අදාළ අය විය යුතු වටිනාකම් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙමින් පවතින බව දැන්වීමට කැමැත්තෙමි. | |
| (ඇ) | විශ්වවිද්‍යාලයේ අනුමත තනතුරු කාණ්ඩ 12 ක් සඳහා දීර්ඝ කාලයක සිට පැවති පුරප්පාඩු 33 පිරවීමට කටයුතු කර නොතිබුණි. අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු 08 ක් සඳහා නිලධාරීන් 11 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර ඔවුන්ගේ සේවා කාලය මාස 05 සිට වර්ෂ 04 දක්වා කාල පරාසයක පැවතුණි. | මෙයින් තනතුරු 06 ක පුරප්පාඩු 22 ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් නොමැතිවීම හෝ අනුමත කර ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් පුරප්පාඩු වී ඇත. සෞඛ්‍ය සේවයේ උපස්ථාන තනතුරු දෙක මෙම අවස්ථාවේ පිරවීම අත්‍යාවශ්‍ය නොවන බව ප්‍රධාන වෛද්‍ය නිලධාරීන් විසින් දැනුම් දී ඇත. අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් රජය මගින් තාවකාලිකව අත්හිටුවීමද පුරප්පාඩු පිරවීම ප්‍රමාදය සඳහා බලපාන ලදී. විශ්වවිද්‍යාලයට අත්‍යවශ්‍ය කටයුතු සඳහා පාලක සභාවේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත මෙම පත්කිරීම් සිදුකර ඇත. | අත්‍යවශය කාර්යමණ්ඩල අවශ්‍යතා සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමටත් පුරප්පාඩු පිරවීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |